## නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

අපරාධ යුක්තිය පසිඳලීම කඩිනමින් හා කාර්යක්ෂමව සිදුකිරීමට අදාළව
නිර්දේශ පිළිබඳ වාර්තාව

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
කාරක සභාවේ සභාපති
2017 සැප්තැම්බර් මස 20 වැනි බදාදා

## சட்ட விவகாரம் (ஊழலுக்கெதிரான) மற்றும் ஊடகத்துறை பற்றிய துறைசார் மேற்பார்வைக் குழு

குற்றவியல் நீதி வழங்குதலை துரிதமாகவும் வினைத்திறனுடனும் மேற்கொள்ளல்
தொடர்பான விதப்புரைகள் தொடர்பிலான அறிக்கை

**கௌரவ அஜித் மான்னப்பெரும அவர்கள்**
குழுவின் தவிசாளர்

2017 செப்தெம்பர் மாதம் 20 ஆம் புதன்கிழமை

Report of the
Sectoral Oversight Committee on Legal Affairs (anti-corruption) and Media
On

# Recommendations Pertaining to the Expeditious and Efficient Administration of Criminal Justice

Presented to the Parliament
By

The Hon. Ajith Mannapperuma
Chairman of the Committee
Wednesday, 20 September 2017.




# නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

**අපරාධ යුක්තිය පසිඳලීම කඩිනමින් හා කාර්යක්ෂමව සිදුකිරීමට අදාළව**

**නිර්දේශ පිළිබඳ වාර්තාව**

***2017 සැප්තැම්බර් මස 20 වැනි බදාදා***

## නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

අධිකරණ හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා මාධ්‍ය යන අමාත්‍යාංශ වල කටයුතු අධීක්ෂණය කිරීම, එහි සාධනීය මට්ටම ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඇගයීම, අධීක්ෂණය හා සමාලෝචනය නිරතුරුව සිදු කිරීම සඳහා නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව පත් කර ඇත.

## නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකයින්

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (සභාපති)
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු රන්ජන් රාමනායක මහතා
ගරු නිමල් ලාන්සා මහතා
ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු ඩලස් අලහප්පෙරුම මහතා
ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා
ගරු දිලුම් අමුණුගම මහතා
ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
ගරු අංගජන් රාමනාදන් මහතා
ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
ගරු හේෂාන් විතානගේ මහතා
ගරු එස්. වියාලේන්දිරන් මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේශන් මහතා
ගරු එම්.එච්.එම්. සල්මන් මහතා
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

## බලතල

පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා වලින් එකක් වන මෙම කමිටුවට ඇති බලතල ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී 2015 දෙසැම්බර් මස 19 වැනි දින සම්මත කරන ලද යෝජනාවේ දක්වා ඇත. මෙම යෝජනාව අන්තර් ජාලයේ www.parliament.lk මගින් ලබා ගත හැක.

## ප්‍රකාශන

කාරක සභාවේ වාර්තා හා ප්‍රකාශන සියල්ල පාර්ලිමේන්තුවේ නියෝගය මත පාර්ලිමේන්තු කාරක සභා කාර්යාංශය මගින් ප්‍රකාශයට පත් කෙරේ. කාරක සභාවේ ප්‍රකාශන සියල්ල (පුවත්පත් නිවේදන ඇතුළුව) පාර්ලිමේන්තු නිල වෙබ් අඩවිය වන www.parliament.lk මගින් ලබා ගත හැක.

## කාරක සභා කාර්ය මඩුල්ල

කාරක සභාවේ වත්මන් කාර්ය මඩුල්ල - ටිකිරි කේ. ජයතිලක මහතා - පාර්ලිමේන්තු සහකාර මහලේකම්, ජගත් ගජවීර ආරච්චි මහතා - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා), ඉන්දිරා දිසානායක මහත්මිය - සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - කාරක සභා කාර්යාංශය, චින්තා බුලත්සිංහල මහත්මිය ප්‍රධාන නිලධාරී, රූපානි ද සොයිසා - සහකාර ප්‍රධාන නිලධාරී

## දැනුම්දීම

සියලු ලිපි ලේඛන, නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව, කාරක සභා කාර්යාංශය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත යොමු කළ යුතුයි. පොදු විමසීම් සඳහා දුරකථන අංකය 011 2777100 අමතන්න.

| | පටුන | පිටු අංකය |
|---|---|---|
| | සාරාංශය | |
| 1 | හැඳින්වීම | 1 |
| 2 | කාරක සභාවට කැඳවන ලද අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතන | 1 |
| 3 | සාක්ෂි | 2 |
| 4 | සලකා බලන ලද වාර්තා | 2 |
| 5 | ශ්‍රී ලංකාවේ අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තුළ බරපතළ ප්‍රමාදයක් සත්‍ය වශයෙන්ම පවතින්නේ ද? | 3 |
| 6 | ක්‍රියාදාමය ශක්තිමත් කිරීම සඳහා ගතයුතු පියවර | 4 |
| 7 | නීතිපති දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතුවල ඵලදායීතාවය වර්ධනය කර කරගැනීම | 5 |
| 8 | අධිකරණයන්හි නඩු කටයුතු ප්‍රමාද වීමට සහ එක් නඩුවක් අඛණ්ඩව විභාග කිරීමට බාධා වන ලඝුලේඛක හිඟයට පිළියම් සෙවීම | 7 |
| 9 | අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා යෝජනා | 8 |
| 10 | අපරාධ මගින් අත්පත් කර ගත් ධනය නැවත අත්පත් කර ගැනීම | 9 |

**සාරාංශය-----------------------------------------------------------------------------**

ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ සාර්ථකත්වය රඳා පැවතීමට නම් වඩා නිවැරදි හා සාධාරණ වූ අධිකරණ තීරණ මහජනතාවට ප්‍රමාදයකින් තොරව ලබාදීම කළ යුතුය. ඒ සඳහා නීතියේ නියමුවන් ලෙස කටයුතු කරනු ලබන නීතිපති දෙපාර්තමේන්තුව හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාව සඳහා, කාර්යක්ෂමව කටයුතු කිරීමට අවශ්‍ය පරිදි නීති රාමුව සකස් කර දීම වර්තමාන රජයේ යුතුකම වේ. වර්තමාන සමාජයේ අවශ්‍යතාවයට සරිලන ආකාරයට මෙම ආයතනයන්හි කටයුතු කිරීමට අවශ්‍ය පරිසරය සකස් කිරීම තුළින් එකී ආයතනයන්හි ක්‍රියාකාරිත්වය කාර්යක්ෂමව හා යාවත්කාලීනව සිදු කළයුතු බැවින් ඒ සඳහා වන අවශ්‍යතාවයන් හඳුනාගෙන සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම වාර්තාව ඉදිරිපත් කිරීමේ අරමුණ වේ.

## 1.) හැඳින්වීම

<u>වින්දිතයාටත්, විත්තිකරුවන්ටත්, පුරවැසියන්ටත් යුක්තිය ඉටුවන කාර්යක්ෂම අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමයක කාලීන අවශ්‍යතාවය</u>

අපරාධ යුක්තිය පසිඳලීම පිළිබඳ ශ්‍රී ලංකාව තුළ පවතින ප්‍රමාදය අවම කිරීම සහ අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කොට අපරාධ වින්දිතයන්ට සහ විත්තිකරුවන්ට මෙන්ම සමස්ත සමාජයටම යුක්තියක් ඉටු කළ යුතුය යන ස්ථාවරය, මෙම ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් උක්ත කාරණය පිළිබඳ විශේෂිත විමර්ශනයක් කිරීමට මූලික හේතුව විය. මිනී මැරුම්, ස්ත්‍රී දූෂණ හා ළමා අපචාර වැනි බරපතල අපරාධ සහ විශේෂයෙන් රාජ්‍ය දේපල හා අදාළ වන වංචාව, අල්ලස, දූෂණය සහ මුදල් විශුද්ධිකරණය පිළිබඳ නඩු විභාග අධික ලෙස ප්‍රමාද වීම පිළිබඳව සමාජය තුළ මතුවී ඇති බරපතළ විරෝධය ආංශික අධීක්ෂණ කාරක සභාවේ විශේෂ අවධානයට ලක්විය. එසේ හෙයින් අපරාධ යුක්තිය පසිඳලීමේදී පවතින ප්‍රමාදයන්ට හේතු හඳුනා ගැනීමත් එයින් අනාවරණය වන්නා වූ ගැටළු නිරාකරණය කොට විත්තිකරුවන්ට මෙන්ම අපරාධ වින්දිතයන්ටද සාධාරණය ඉටු වන්නා වූ කාර්යක්ෂම යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමයක් ස්ථාපිත කිරීමත් කෙරෙහි කමිටුවේ අවධානය යොමු විය.

## 2.) කාරක සභාවට කැඳවන ලද අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතන

- අධිකරණ අමාත්‍යාංශය
- නීතිපති දෙපාර්තමේන්තුව
- නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා නීතිඥ සංගමය
- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, අධ්‍යක්ෂ ජනරාල් - ඒකාබද්ධ අධ්‍යක්ෂ

## 3.) සාක්ෂි

ඉහත කරුණුවලට අදාළව ආංශික අධීක්ෂණ කාරක සභාව, 2017.08.11, 2017.08.23, සහ 2017.09.08 වැනි දින රැස්වී සාකච්ඡා කරන ලද අතර පහත සඳහන් නිලධාරීන්ගේ සාක්ෂි සහ අදහස් ලබා ගන්නා ලදී.

i. නීතිපති, ජනාධිපති නීතිඥ ජයන්ත ජයසූරිය මහතා
ii. අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා
iii. අතිරේක සොලිසිටර් ජනරාල්, ජනාධිපති නීතිඥ යසන්ත කෝදාගොඩ මහතා
iv. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්, පද්මසිරි ජයමාන්න මහතා
v. ශ්‍රී ලංකා නීතිඥ සංගමය නියෝජනය කරමින් එහි භාණ්ඩාගාරික, නීතිඥ සුජීවලාල් දහනායක මහතා

## 4.) සලකා බලන ලද වාර්තා

ඊට ඉහත සඳහන් වාර්තා වලට අමතරව පහත සඳහන් වාර්තා සහ ලේඛන මෙම ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සලකා බලන ලදී.

i. දණ්ඩ නීති සංග්‍රහය සහ අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීමට අදාළව පත්කරනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු බී. පී. අලුවිහාරේ මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුතු විශේෂ කමිටුව ( Special Committee on Amending the Penal Code and the Code of Criminal Procedure Act) මගින් නිකුත් කරන ලද 2017.02.09 දිනැති දෙවැනි අතුරු වාර්තාව.

ii. අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2017. 08.30 දිනැතිව ඉදිරිපත් කරන ලද "අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව කාර්යක්ෂම කිරිම සඳහා වූ යෝජනා" නමැති වාර්තාව.

iii. 2017.08.23 දින මෙම අධීක්ෂණ කාරක සභාවේ උපදෙස් පරිදි නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද 2017.08.30 දිනැති "නීතිපති දෙපාර්තමේන්තුවේ ඵලදායීතාව වර්ධනය කිරීම සම්බන්ධ නීතිපතිතුමාගේ වාර්තාව" නමැති වාර්තාව.

iv. නීතිපති දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අදාළව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කරන ලද 2015.08.25, 2015.10.19 සහ 2015.11.30 දිනැති ලිපිවල පිටපත්.

v. අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ලඝුලේඛක තනතුරු හා සම්බන්ධව පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම පිළිබඳ 2017.08.25 දිනැති වාර්තාව.

vi. “Criminal Justice System of Sri Lanka, A Pragmatic approach to enhancing it’s efficiency” යන මැයින් අතිරේක සොලිසිටර් ජනරාල්, ජනාධිපති නීතිඥ යසන්ත කෝදාගොඩ මහතා විසින් සකස් කරන ලද වාර්තාව.

ඉදිරිපත්වූ අදහස් හා සාක්ෂි සලකා බැලීමේදී වින්දිතයන්ටත්, විත්තිකරුවන්ටත්, ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන්ටත් යුක්තිය ඉටුවන්නාවූ කාර්යක්ෂම අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමයක් තහවුරු කිරීම සඳහා කඩිනමින් පියවර ගත යුතුව ඇති බව පැහැදිලි විය.

## 5.) ශ්‍රී ලංකාවේ අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තුළ බරපතල ප්‍රමාදයක් සත්‍ය වශයෙන්ම පවතින්නේ ද?

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු බී.පී. අලුවිහාරේ මැතිතුමා ගේ සභාපතිත්වයෙන් යුතු දණ්ඩ නීති සංග්‍රහයේ සහ අපරාධ නඩු විධාන සංග්‍රහයේ සංශෝධනයන් පිළිබඳව සොයා බැලීම සඳහා පත් කළ කමිටුවේ 2017.02.09 දිනැති වාර්තාව මගින් පහත සඳහන් නිගමනවලට වලට එළැඹ තිබිණි.

i. වරද සිදු කළ දිනය සහ අධිචෝදනාව මහාධිකරණයට ගොනු කිරීම අතර කාලය (සාමාන්‍ය) - වසර 4.7 යි.

ii. අධිචෝදනාව ගොණු කරන දිනයේ සිට සත්‍යය ලෙසම අදාළ නඩුවේ නඩු විභාගය ආරම්භ වන දිනය අතර කාලය (සාමාන්‍ය) - වසර 3.7 යි.

iii. මහාධිකරණයේදී නඩුවේ සාක්ෂි විභාගය ආරම්භ වීම සහ නඩුවේ තීන්දුව අතර කාලය (සාමාන්‍ය) - වසර 1.8 යි.

ඒ අනුව මහාධිකරණයේදී විභාග කළ යුතු බරපතල අපරාධ වරදක් සිදු වන දිනයේ සිට එම නඩුව මහාධිකරණයේදී විභාග කොට අවසන් වන දිනය අතර වූ කාලයේ සාමාන්‍ය අගය - වසර 10.2කි.

තවද එකී වාර්තාව අනුව මහාධිකරණයේ විභාග වන නඩුවකින් පසු අභියාචනාධිකරණයට සහ ශ්‍රේෂ්ඨාධිකරණයට ඇති අභියාචනා අවස්ථා දෙක අවසන් වීම සඳහා තවත් වසර හත (07) ක් සාමාන්‍ය වශයෙන් ගතවේ. ( Entire Criminal Justice Response to serious Crimes seems to consume, on average approximately 17 years) අපරාධ යුක්තිය පසිඳලීමේදී පවතින මෙම බරපතල සහ ලැජ්ජා සහගත ප්‍රමාදය පිටුදැකීම සඳහා කඩිනමින් පියවර ගැනීම රජය සතු වගකීමක් බවත්, එසේ ක්‍රියා කිරීමේදී විත්තිකරුවාට සහ අපරාධ වින්දිතයාට සාධාරණ නඩු විභාගයක් ( Fair trial) සඳහා ඇති හිමිකම අහිමි නොවීම පිණිස වග බලාගත යුතු බවත් කාරක සභාවේ අදහස විය.

විශේෂයෙන්ම සංකීර්ණ කරුණු සහිත ලේඛන විශාල ප්‍රමාණයක් සහ සාක්ෂිකරුවන් විශාල ප්‍රමාණයක් සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන අල්ලස, දූෂණය සහ මුදල් විශුද්ධිකරණය වැනි චෝදනා සහිත නඩු වලදී නඩු කටයුතු අසීමිත ලෙස ප්‍රමාද වීමේ අවදානමක් ඇති බව මෙම කමිටුව ඉදිරියේ සාක්ෂි කරුවන් විසින් ඉදිරිපත් කළ කරුණු අනුව අනාවරණය විය. එසේ හෙයින් දැනට ගොඩගැසී ඇති නඩු කඩිනමින් අවසන් කිරීම සඳහාත්, ඉදිරියේදී ඇති විය හැකි බරපතළ චෝදනා වලට අදාල අධිචෝදනා ඉක්මනින් විභාග කොට අවසන් කිරීම සඳහාත් පොදුවේ ශ්‍රී ලංකාව තුළ අපරාධ යුක්තිය පසිඳලීමේ

ක්‍රියාදාමය ශක්තිමත් කිරීම සඳහාත්, විවිධ ක්‍රමවේදයන් සමාන්තරව භාවිතා කිරීම අත්‍යවශ්‍ය බව කාරක සභාවේ මතය විය.

## 6.) ක්‍රියාදාමය ශක්තිමත් කිරීම සඳහා ගතයුතු පියවර

i. රුපියල් මිලියන පහකට වැඩි වටිනාකමකින් යුතු අල්ලස්, වත්කම්, දූෂණ, මුදල් විශුද්ධිකරණය, වංචාව, සාපරාධී සාවද්‍ය පරිහරණය, සාපරාධී විශ්වාසය කඩ කිරීම් සහ කූට ලේඛණ සෑදීම සහ වෙනත් එවැනි අක්‍රමිකතා පිළිබඳව, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව විශේෂ අධිකරණ විභාග ( Trial at Bar) අනිවාර්යයෙන් පැවැත්වීමට අවශ්‍යය පියවර නීතිපතිවරයා විසින් ගැනීම සහ ඒ පිළිබඳව ගරු අගවිනිසුරුවරයාව නීතිපති විසින් දැනුවත් කිරීම.

ii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 (1) (ඇ) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් දූෂණ විරෝධී මහාධිකරණයක් (anti-corruption high court) අලුතින් පිහිටුවීම කළ යුතුය. එකී මහාධිකරණය විසින් දැනට පවතින නීති මගින් අර්ථ නිරූපණය කර ඇති වැරදි පිළිබඳව මහාධිකරණ විනිශ්වයකාරවරුන් තිදෙනෙකුගෙන් යුතු විනිශ්චය මණ්ඩල තුනක් මගින් අඛණ්ඩව ( day to day trial) නඩු විභාග පැවැත්වීම.

iii. මහාධිකරණ විනිසුරුවරුන් ගේ උපරිම සංඛ්‍යාව 110 ක් දක්වා වැඩි කිරීම සහ ඊට අදාළව 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත වහාම සංශෝධනය කිරීම.

iv. මහාධිකරණයන්හි නඩු විභාගයට පූර්වයෙන් වූ ක්‍රියාදාමය වේගවත් කොට දිනපතා නඩු විභාග ( day to day trial) පවත්වා ගැනීමට හැකිවන වාතාවරණය ගොඩනැගීමට පහසුවනු පිණිස වාර්තාධිකාරි විනිසුරන් (Recorder Judges) පත් කිරීම.

v. මිනී මැරුම්, මිනී මැරීමට තැත් කිරීම්, ස්ත්‍රී දූෂණ සහ ළමා අපචාර ඇතුළු සියලු වැරදි වලට අදාළව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 263 (1) වගන්තියේ දක්වා ඇති පරිදි මහාධිකරණ නඩුවක නඩු විභාගය ආරම්භ කළ පසු, දිනපතා අඛණ්ඩව එම නඩුව විභාග කිරීම. ( day to day trial) පිළිබඳ වූ අනිවාර්යය විධානය සත්‍ය ලෙසම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

vi. නඩු විශාල ලෙස ගොඩ ගැසී ඇති මහාධිකරණ ලෙස හඳුනාගත් අනුරාධපුර, මහනුවර, ගම්පහ සහ රත්නපුර යන ප්‍රදේශවල තවත් එක් මහාධිකරණයක් බැගින්ද, මාතලේ නව මහාධිකරණයක්ද, කොළඹ ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන තවත් මහාධිකරණ 5 ක් ද වශයෙන් අලුතින් මහාධිකරණ 10ක් ආරම්භ කිරීම.

vii. ළමා අපචාර නඩු විභාග කිරීම සඳහාම වෙන්වූ මහාධිකරණයක් දැනට අනුරාධපුරයේ පවත්වාගෙන යනු ලබයි. ඒ ආකාරයටම ළමා අපචාර නඩු විභාග කිරීම සඳහා විශේෂයෙන් වෙන්කරන ලද මහාධිකරණයක් කොළඹදී ආරම්භ කළ යුතුය.

## 7.) නීතිපති දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතුවල ඵලදායීතාවය වර්ධනය කර කරගැනීම

නීතිපති දෙපාර්තමේන්තුව ශතවර්ෂයකට වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ යුක්තිය පසඳලීමේ ක්‍රියාදාමයෙහි සුවිශේෂීය මෙහෙවරන් ඉටු කරනු ලබන විශිෂ්ටතම රාජ්‍ය ආයතනයකි. අපරාධ සහ සිවිල් නීති ක්ෂේත්‍ර දෙකටම අදාළව රජය වෙනුවෙන් පෙනී සිටීම නීතිපතිවරයාගේ වගකීම වේ. 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් නීතිපතිවරයාගේ ධූරයේ ස්වාධීනත්වය නැවත වරක් තහවුරු කරන ලද නමුත් නීතිපති දෙපාර්තමේන්තුවවෙත පවරන ලද කාර්ය භාරය ඉටු කිරීම ප්‍රමාණවත් වේගයකින් සිදු නොවීම පිළිබඳව එකී ආයතනය මහජන විවේචනයට ලක්වීම නිරීක්ෂණය කරන ලදී. මෙම තත්ත්වය පිළිබඳ වර්තමාන නීතිපති වරයා මෙම කාරක සභාව ඉදිරියේ සාක්ෂි දුන් අතර පසුව කාරක සභාවේ උපදෙස් පරිදි 2017.08.30 දිනැති ලිඛිත වාර්තාවද ඉදිරිපත් කරන ලදී.

මානව සම්පත ප්‍රමාණවත් ලෙස නොමැතිවීම, ඉටු කරන සේවයට ප්‍රමාණවත් තරම් වැටුප් රජයේ අධිනීතිඥයන් වෙත නොලැබීම, පුරප්පාඩු නියමිත කාලය තුළ පුරවා ගැනීමට අපොහොසත් වීම සහ වගකිව යුතු වෘත්තිකයන් ලෙස සුවපහසු ලෙස තම වගකීම් ඉටුකිරීමට අවශ්‍ය කරන කාර්යාල ඉඩකඩ පහසුකම් නොමැතිවීම පිළිබඳව ගැටලු මෙම කාරක සභාව විසින් හඳුනාගන්නා ලදී.

ඉතාම අවම වැටුපකට අධික වැඩ ප්‍රමාණයක් ඉටුකරන රජයේ අධිනීතිඥ වරුන්ගේ සේවය මෙම කාරක සභාවේ ඇගයීමට ලක් වනු බවද සඳහන් කළ යුතුය.

නීතිපති දෙපාර්තමේන්තුවට අදාළව පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරන ලදී.

අ). නව අධිචෝදනා ගොනු වීමේ වේගය අඩාල වීම සහ නීතිපති දෙපාර්තමේන්තුව තුළ ගොඩගැසුණු ගොණු ප්‍රමාණය තවදුරටත් එලෙසම පැවතීම.

ආ). නඩු මෙහෙයවන රජයේ අධිනීතිඥවරුන්ට එක් එක් දිනයට කැඳවීමට ඇති නඩු සඳහා ප්‍රමාණවත් ලෙස සූදානම් වීමට නොහැකි වීම.

ඇ). නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ ධූරයන්හි ඇති පුරප්පාඩු සඳහා දක්ෂ නවක නීතිඥවරුන් සහ නීතිඥවරියන් අයදුම් නොකිරීමේ ප්‍රවණතාවයක් ඇති වී තිබීම.

නීතිපති දෙපාර්තමේන්තුවේ රාජකාරි ඉටු කිරීමේ ඵලදායිතාව වර්ධනය කිරීමට සහ නීතිපති දෙපාර්තමේන්තුව රාජ්‍ය සේවය තුළ අත්පත් කරගෙන තිබූ අභිමානවත් තත්ත්වය නැවත ස්ථාපිත කිරීම සඳහා වැදගත් වූ යෝජනා ගණනාවක් නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද 2017.08.30 දිනැති වාර්තාවේ දක්වා ඇත. (එකී ලේඛනය මෙම වාර්තාවේ ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත.)

නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවද, අධිකරණ අමාත්‍යාංශය වෙනුවෙන් එම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද කරුණු ද, ශ්‍රී ලංකා නීතිඥ සංගමය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද කරුණුද, සලකා බැලීමෙන් පසුව පහත සඳහන් යෝජනා මෙම කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලැබේ. අපරාධ යුක්තිය පසිඳලීමට අදාළව රට තුළ නීතිපති දෙපාර්තමේන්තුව පිළිබඳව සහ රජය කෙරෙහි

මතු වී ඇති විවේචන වලට ප්‍රතිචාර ලෙස පහත සඳහන් යෝජනා ජාතික වැදගත්කමකින් යුතු කරුණු ලෙස සලකා අප්‍රමාදීව ක්‍රියාත්මක කළ යුතු බව මෙම කාරක සභාව නිර්දේශ කරයි.

i. නීතිපති දෙපාර්තමේන්තුවේ සියලුම නීති නිලධාරීන්ගේ වැටුප් සහ දීමනා වහාම ප්‍රතිශෝධනය කොට දෙපාර්තමේන්තුව සතු දක්ෂ සහ පළපුරුදු නිලධාරීන් තවදුරටත් රඳවා ගැනීමට පියවර ගත යුතු වන අතර, වැඩි දක්ෂතාවයකින් යුතු නවක නිලධාරීන් බඳවා ගැනීමට අවශ්‍ය කරන වෘත්තිමය ආකර්ෂණය ඇති කළ යුතුයි. මේ පිළිබඳ වූ යෝජනා මීට පෙර රජය වෙත ඉදිරිපත් කර ඇති නමුත් ඒවා ක්‍රියාත්මක කර නොමැති බව පැහැදිලි වේ.

(රජයේ අධිනීතිඥවරයකු වශයෙන් බඳවා ගන්නා අයෙකුගේ ආරම්භක වැටුප, 5/2016 රාජ්‍ය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ මහේස්ත්‍රාත්වරුන්ට නියමිත JS - I වැටුප් තලයට එක් පියවරක් අඩුවෙන් තැබිය යුතු බව කමිටුවේ තීරණය විය.)

ii. රජයේ අධිනීතිඥ තනතුර සඳහා "අනුමත" තනතුරු සංඛ්‍යාව 118 සිට 218 දක්වා ඉහළ නැංවිය යුතුය. අලුතෙන් බඳවා ගන්නා නිලධාරීන් 100 අතරින් 50ක් 2018 ජනවාරි මස දී සහ ඉතිරි 50 දෙනා එක් වරකට 25 දෙනා බැගින් 2018 මැයි/ජූනි මාසයන්හි සහ 2019 ජනවාරි මාසයේ දී බඳවා ගත යුතුය.

iii. රජයේ අධිනීතිඥයන් අළුතින් බඳවා ගැනීම සඳහා දැන්වීම් පළ කිරීමට අමතරව, ශ්‍රී ලංකාවේ එක් එක් විශ්වවිද්‍යාලයේ නීතිවේදී උපාධිය සමත් වීමේ දී සහ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසාන විභාගය සමත් වීමේ දී ඉහළ පන්ති සාමාර්ථ ලබා ගන්නා නවක නීතිඥයින්, රජයේ අධිනීතිඥයින් ලෙස සෘජුවම බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණවලට යොමු කරන ලෙසට නීති පීඨාධිපතිවරුන්ට සහ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ විදුහල්පතිවරයාට, නීතිපතිවරයා විසින් දැනුම් දිය යුතුය.

iv. අවසන් නොවූ අධිචෝදනා 50 කට වඩා ඇති සෑම මහාධිකරණයකටම දැනට සිටින රජයේ අධිනීතිඥවරයාට අමතරව තවත් රජයේ අධිනීතිඥවරයකු බැගින් අනුයුක්ත කළ යුතුය.

v. දිවයින පුරා ඇති මහාධිකරණ වල පිහිටි රජයේ අධිනීතිඥ නිලමැදිරි සඳහා දැනට සිටින කාර්යාල කාර්ය සහායක ට අමතරව, තවත් කාර්යාල කාර්ය සහායකවරයෙකු, ළඝු ලේඛකයකු සහ උසාවි ලිපිකරුවකු ලබාදිය යුතුය.

vi. නීතිපති දෙපාර්තමේන්තුව සඳහා ඉදිවන නව ගොඩනැඟිල්ලේ කටයුතු 2019 වසරේ අප්‍රේල් මාසයේදී පමණ අවසන් වීමට නියමිත බැවින් නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරන තෙක් නිලධාරීන් 100කට පමණ සුදුසු ගොඩනැගිල්ලක් කුලී පදනමක් මත අලුත්කඩේ ප්‍රදේශයට ආසන්න ප්‍රදේශයකින් ලබාදිය යුතු අතර, එවැනි ගොඩනැගිල්ලක එක් නිලමැදිරියක රජයේ අධිනීතිඥවරුන් උපරිම වශයෙන් දෙදෙනකුටවත් සුව පහසු ලෙස තම රාජකාරි කටයුතු කිරීමට අවශ්‍ය පරිසරය සැකසිය යුතුය.

vii. ආරක්ෂාව තහවුරු කිරීමටත් සේවයේ කාර්යක්ෂමතාවය වර්ධනයටත් ඉවහල් වන පරිදි නීතිපති දෙපාර්තමේන්තුවේ සියලු නීති නිලධාරීන් සඳහා නිල රථ පහසුකම් ලබාදිය යුතුය.

viii. නීතිපති දෙපාර්තමේන්තුවේ "තොරතුරු තාක්ෂණ ඒකකයක්" වහාම ස්ථාපිත කිරීම මගින් දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු කාර්යක්ෂම කළ යුතුය.

ix. නීතිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන අංශයේ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥවරයකුගේ අධීක්ෂණය යටතේ සේවා කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකුගේ සේවය ලබා දිය යුතුය. එමගින් නීතිපති දෙපාර්තමේන්තුවේ දැනට පුළුල් වී ඇති පරිපාලනමය කටයුතු සුමටව සහ කාර්යක්ෂමව කරගෙන යාමත් නීති නිලධාරීන්ගේ ඵලදායීතාවය වර්ධනය කර ගැනීමත් අපේක්ෂා කරනු ලබයි.

x. නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා විධිමත් හා ප්‍රමාණවත් පශ්චාත් උපාධි අධ්‍යයන අවකාශ ලබාදීම සඳහා පියවර ගත යුතුව ඇත.

ඊට අමතරව නීතිපතිවරයාගේ 2017.08.30 දිනැති වාර්තාවේ ඇති අනෙකුත් කරුණු කෙරෙහි අධිකරණ අමාත්‍යාංශයේ අවධානය විශේෂයෙන් යොමු කළ යුතු බවට නිර්දේශ කරනු ලැබේ. නිතිපති දෙපාර්තමේන්තුව රජයේ තවත් එක් දෙපාර්තමේන්තුවක් පමණක් නොවන බවත් එකී දෙපාර්තමේන්තුව සතු සුවිශේෂී වූ වගකීම් ඉටුකිරීමට හැකි පහසුකම් සහ පරිසරය සකස් කිරීම රජයේ වගකීම බවත් විශේෂයෙන් මතක තබාගත යුතුය. ශ්‍රී ලංකා මහ බැංකුව, පාර්ලිමේන්තු වැනි ආයතන වල ඇති සුවිශේෂී වගකීම් පිළිබඳ සලකා එම ආයතන වල නිලධාරීන්ට විශේෂිත වූ දීමනා වැටුපට ලබා දීමට කටයුතු කර ඇති බවත්, විශේෂිත පහසුකම් ලබා දී ඇති බවත්, පෙන්වා දීමට කැමැත්තෙමු. නීතිපති දෙපාර්තමේන්තුවද එවැනි විශේෂ තත්වයකට ඔසවා තැබීම ඉතා පහසුවෙන් සාධාරණීකරණය කළ හැකි බව අවධාරණයෙන් සඳහන් කළ යුතුය.

## 8.) අධිකරණයන්හි නඩු කටයුතු ප්‍රමාද වීමට සහ එක් නඩුවක් අඛණ්ඩව විභාග කිරීමට බාධා වන ලඝුලේඛක හිඟයට පිළියම් සෙවීම

ප්‍රමාණවත් ලඝුලේඛකයින් නොමැතිවීම සිවිල් සහ අපරාධ යන ක්ෂේත්‍ර දෙකේම නඩු ප්‍රමාද වීමට ඉතා බරපතල හේතුවක් වී ඇත. විශේෂයෙන්ම මහාධිකරණයන්හි විභාග වන බරපතල අපරාධ නඩු දිනපතා අඛණ්ඩව ( day to day ) විභාග කිරීමට ඇති ප්‍රධානතම බාධාවක් වන්නේ සාක්ෂි සටහන් නියමිත වේලාවට ලබා ගැනීමට නොහැකිවීම පිළිබඳව ප්‍රශ්නයයි. මෙම ප්‍රශ්නය හඳුනා ගෙන දිගු කාලයක් ගත වී ඇතත්, අවශ්‍ය විසඳුම් ක්‍රියාත්මක කිරීමට අධිකරණ අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ රාජ්‍ය ආයතන අපොහොසත් වී ඇත. ඊට අදාළව 2017.08.25 වන දින දරණ අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ වාර්තාව මේ සමග ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර සිටී. ඊට අදාළව පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරන අතර එම විසඳුම් මාස හයක් තුළ ක්‍රියාත්මක කොට අවසන් කරන ලෙස නිර්දේශ කරනු ලැබේ:

i. බඳවා ගැනීමේ සුදුසුකම් වලට අදාළ අ.පො.ස. සාමාන්‍ය පෙළ ගණිතය විෂය සඳහා දැනට ඇති "සම්මාන" සාමාර්ථය වෙනුවට "සාමාන්‍ය" සාමාර්ථයක් ඇතුළත් කිරීම.

ii. ලඝු ලේඛකයින් පුහුණු ශ්‍රමිකයින් (Skilled Labour) ලෙස සැලකිය හැකි හෙයින් ඔවුන්ගේ වැටුප් MT2 2016 වැටුප් පරිමාණය දක්වා ඉහළ දැමීම.

iii. බඳවා ගැනීමේ වයස් සීමාව අවුරුදු 45 දක්වා වැඩි කිරීම.

iv. ලඝුලේඛක තනතුරු සඳහා, කොන්ත්‍රාත් පදනම මත දෛනික දීමනා ගෙවීමට නුපුහුණු ශ්‍රමිකයින් බඳවා ගැනීමට අවස්ථාව සලසා, අනතුරුව ඔවුන් පුහුණු වූ පසු ස්ථිර සේවයට බඳවා ගැනීමේදී එසේ කොන්ත්‍රාත් පදනම මත පුහුණුව ලැබූ අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබාදීම.

v. සෑම මහාධිකරණයකම නඩු කටයුතු හඬ පටිගත කිරීම ( Audio Recording) හා කථා හඳුනාගැනීම (Speech Recognision) අනිවාර්ය කිරීම සහ සටහන් සකස් කිරීමේ දී අවශ්‍ය තාක්ෂණික පහසුකම් ලබාදීම.

vi. විශ්‍රාමික ලඝු ලේඛිකාවන්ට දිරිගන්වන සුලු දීමනාවක් මත කොන්ත්‍රාත් පදනම යටතේ වහාම සේවයට බඳවා ගැනීම.

vii. “ලඝු ලේඛනය” පිළිබඳ පාඨමාලාවක් රජයේ කාර්මික විද්‍යාලයක නැවත ආරම්භ කිරීම.

## 9.) අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා යෝජනා

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් පසුගිය වසර විසි තුන තුළ සිදුකර ඇති පරීක්ෂණ වලින් පසුව “දූෂණය” වරද සඳහා අධිකරණයක් මගින් විත්තිකරුවකු වරදකරුවකු කොට ඇත්තේ අවස්ථා තුනක දී පමණි. මෙය දැනට එම කොමිෂන් සභාව ක්‍රියාත්මකක වන ආකාරය සහ ඊට ඇති බලතල අඩු කම පිළිබඳ කනගාටුදායක දර්ශකයක් බව සඳහන් කළ යුතුය. පැමිණිලි මෙහෙයවීම සඳහා දක්ෂ නීතිඥයන් කොමිෂන් සභාව තුළ නොමැති වීම බලවත් ප්‍රශ්නයක් ලෙස හඳුනාගෙන ඇත. තවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව අනිවාර්යයෙන් බැඳී සිටින දූෂණයට එරෙහි එක්සත් ජාතින්ගේ සම්මුතියේ ප්‍රතිපාදන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට අදාළව දේශීය නීති සකස් කිරීම තවමත් සිදුකර නැත.

අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව කාර්යක්ෂම කිරීම සඳහා අදාළ වූ, 2017.08.30 දිනැති අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ වාර්තාව මේ සමඟ ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරන අතර,

1. 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභා පනත සඳහා අවශ්‍ය සංශෝධන මාස හයක් තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කරගත යුතු බව යෝජනා කර සිටී.

2 . වත්කම් හා බැරකම් පිළිබඳ නීතිය යාවත්කාලීන කිරීම සඳහා නීති සංශෝධන මාස හයක් තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කර ගත යුතු බව යෝජනා කර සිටී.

## 10.) අපරාධ මගින් අත්පත් කර ගත් ධනය නැවත අත්පත් කර ගැනීම

අපරාධ මගින් අත්පත් කරගන්නා ලද ධනය, නැවත රජය වෙත අත්පත් කරගැනීම සඳහා අදාළ වන නීති, ජාතික වශයෙන් ප්‍රමුඛතාවයක් ඇති කරුණක් ලෙස සලකා, කඩිනමින් සම්මත කර ගත යුතුය. තවද ඉහත කී නව නීතිය හඳුන්වා දීම සහ යෝජනා කර ඇති අනෙකුත් නීති සංශෝධන කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ වගකීම අධිකරණ අමාත්‍යාංශය විසින් භාරගත යුතුය.

මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන තක්සේරු කොට මෙම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සති 2ක් ඇතුළත මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට අධිකරණ අමාත්‍යාංශය විසින් වගබලා ගත යුතුය.

මෙම වාර්තාව අදාළ විෂයභාර අමාත්‍යවරයා වන අධිකරණ අමාත්‍යවරයාටත් ගරු අගමැතිතුමා හා ගරු ජනාධිපතිතුමාටත් ඉදිරිපත් කිරීමට කාරක සභාව කටයුතු කරනු ඇත.

එසේම මෙම වාර්තාවෙහි ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම අධිකරණ අමාත්‍යාංශයේ වගකීමක් වන අතර වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර මාස 6ක් ඇතුළතදී අදාළ නිර්දේශ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර අවසන් කළ යුතුය.

මෙම වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය මෙම කාරක සභාව විසින් සති දෙකෙන් දෙකට සමාලෝචනය කරනු ඇත.